**ආර්ථික අර්බුදයේ බලපෑම් අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය (අවිනිශ්චිත හා හදිසි අවශ්‍යතා සංරචක ව්‍යාපෘතිය -2) (CERCs-2) - 2022**

---

ආර්ථික අර්බුදයේ බලපෑම් අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය (අවිනිශ්චිත හා හදිසි අවශ්‍යතා සංරචක ව්‍යාපෘතිය -2) (CERCs-2) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ලෝක බැංකුව අතර 2021 නොවැම්බර් 03 දිනැතිව ඇති කර ගත් අංක 9290-එල්කේ දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපාති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, මුදල් අමාත්‍යාංශය සහ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතන වන අතර කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සහ රට පුරා ජීවත් වන දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජනතාවගේ ජීවනෝපාය ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 108,062 කට සමාන එ.ජ.ඩො. මිලියන 325 ක් වූ අතර ලෝක බැංකුව විසින් එම මුදල මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2022 මැයි 09 දින ආරම්භ කර 2023 නොවැම්බර් 09 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය කාර්යසාධනය

අරමුදල් උපයෝජනය කිරීම

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකවරයාගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබා දී ඇති අත්තිකාරම් මුදලින් ප්‍රතිලාභී දීමනා ගෙවීමෙන් පසුව, අධි තක්සේරුව හේතුවෙන් ඉතිරි වූ රු.මිලියන **1,096** ක සහ රු. මිලියන **93** ක මුදල අනුපිළිවෙලින් මාස **4** ක සහ මාස **8** ක ප්‍රමාදයක් සහිතව **2022** දෙසැම්බර් **29** සහ **2023** අප්‍රේල් **18** යන දිනවල දී නිරවුල් කරන ලදී. | ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙමි. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිවැරදි දත්ත භාවිතා කරමින් අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම එ.ජ.ඩො. මිලියන **325** ට සමාන වූ රු. මිලියන **108,225** ක් වූ අතර එම මුදල **2022** වර්ෂයේදී සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා විය. සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ මුළු අරමුදල් උපයෝජනය රු. මිලියන **99,903** කට සමාන වූ එ.ජ.ඩො. මිලියන **274.37** ක් වූ අතර එය ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට **84** ක් වී තිබුණි. | එකඟ විය. | සියලු ඉලක්ක අපේක්ෂිත පරිදි සාක්ෂාත් කර ගැනීමට සහ ප්‍රතිපාදන අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ රජයේ ණය කළමනාකරණ තොරතුරු පද්ධතියට අනුව, ප්‍රතිලබ්ධි නොවූ ණය මුදල සඳහා බැඳීම් ගාස්තු ලෙස රු. මිලියන **2.26** කට සමාන එ.ජ.ඩො. **6,934.5** ක් ණය දෙන නියෝජිතායතනය වෙත ගෙවා තිබුණි.<br><br>රු. මිලියන **2.26** ක බැඳීම් ගාස්තු ණය දෙන ආයතනයට අනාර්ථික ලෙස ගෙවා තිබුණි. | අන්තර්කරණ සම්බන්ධතා සංවර්ධන ව්‍යාපෘතිය (**ICDP**) යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට එ.ජ.ඩො. මිලියන **500** ක මුදලක් වෙන් කර ඇත. කෙසේ වුවද, රටේ හදිසි තත්ත්වය හේතුවෙන්, ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීමේ සහ මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සමාජ ස්ථාවරත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අරමුණ ඇතිව අන්තර්කරණ සම්බන්ධතා සංවර්ධන ව්‍යාපෘතිය (**ICDP**) - **CERCs** සක්‍රීය කිරීම මගින් එ.ජ.ඩො. මිලියන **325** ක මුදලක් නැවත වෙන් කරන ලදී. ඒ අනුව, සමස්ත **ICDP** ව්‍යාපෘතිය සඳහා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය ද ඇතුළුව) විගණන නිරීක්ෂණවල සඳහන් කර ඇති එ.ජ.ඩො. **679,985.04** ක් වූ බැඳීම් ගාස්තු ගෙවා ඇති බව නිරීක්ෂණය වේ. | වෙන් කරන ලද මුළු අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.** භෞතික කාර්යසාධනය

| සංරචකය/ | **2022** දෙසැම්බර් **31** දිනට | විගණන | කළමනාකාරිත්වයේ අදහස් | විගණකවරයාගේ |
|---|---|---|---|---|

| ක්‍රියාකාරකම / උප ක්‍රියාකාරකම | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්පත් කර ගත් කාර්යසාධනය | නිරීක්ෂණය | දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම සහ ආහාර සුරක්ෂිතතා පොහොර | යූරියා පොහොර මෙට්‍රික් ටොන් **150,000**ක් මිල දී ගෙන **2022/23** මහ කන්නය තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් ගොවි ප්‍රතිලාභීන් **1,000,000** ක් සඳහා බෙදා හැරීම. | **2022** දෙසැම්බර් මාසය අවසන් වන විට යූරියා මෙට්‍රික් ටොන් **107,713**ක් ප්‍රසම්පාදනය කර තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය මගින් යූරියා පොහොර ටොන් **150,000**ක් ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂා කර තිබුණ ද, **2022** වර්ෂයේදී ප්‍රසම්පාදනය කර ඇති මුළු ප්‍රමාණය ටොන් **107,713** ක් පමණක් විය. පොහොර තොගය බෙදාහරින ලද ගොවි ප්‍රතිලාභීන් සංඛ්‍යාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන්, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ සහ ලෝක බැංකුවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් **2023.03.08** දින පැවැති රැස්වීමේදී ගත් තීරණය මත පදනම්ව, **2022/23** මහ කන්නය සඳහා බෙදා හරින ලද පොහොර මගින් ප්‍රතිලාභ ලැබූ ගොවි ප්‍රතිලාභීන්ගේ පොහොර භාවිතය පිළිබඳ තොරතුරු ඉල්ලා **2023.03.10** දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යවන ලදී. | අපේක්ෂිත පරිදි ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |